මාවතගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
-----------------------------

**1.** <u>මූල්‍ය ප්‍රකාශන</u>

**1.1** <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2** <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

**1.3.1** <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල වෙන් කිරීම් කර නොතිබුණි.

(ආ) ඉඩම් කට්ටි කිරීමේදී ප්‍රාදේශීය සභාවට පවරා තිබූ රු.22,842,650 ක් වටිනා ඉඩම් කට්ටි 17 ක වටිනාකම ගිණුම්වලින් ඇත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ආදායම වූ රු.11,370,359 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ පැවති ඉඩම්/ගොඩනැගිලි ඒකක 06 ක වටිනාකම ආගණනය කර ගිණුම්ගත කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාවේ ගබඩා ලැබීම් පත්‍ර මඟින් භාණ්ඩ තොග වශයෙන් ලැබෙන අවස්ථාවල කිසිදු ගිණුම් සටහනක් නොතබන අතර ඒ සඳහා මුදල් ගෙවීමේදී එම වටිනාකම පමණක් ගබඩා අත්තිකාරම් ගිණුම හර කරයි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමියන්ට ගෙවිය යුතුව තිබූ රු.1,218,577 ක් වටිනා ණයහිමි ශේෂ ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ ලැබුණු රු.3,000,000 ක ආධාර මුදල පුනරාවර්තන ආදායම යටතේද එහි වියදම පුනරාවර්තන මෙන්ම ප්‍රාග්ධන වියදම් යටතේද ගිණුම් තබා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල අවසන් ශේෂයන් හා ඊට අනුරූපී, උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු.6,088,861 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.42,292,224 ක් වූ අතර එයින් රු.2,298,068 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවති ශේෂයන් විය.

(ii) ලැබිය යුතු ගිණුම ශේෂය තුළ වසර 12 කට පමණ පෙර සිට අය නොවී පවතින රු.1,149,245 ක ශේෂ 03 ක් විය.

1.3.4 **ගෙවිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 38,686,509 ක් වූ අතර ඒ තුළ වසර 03 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොමති රු.5,003,276 ක ශේෂයක් පැවතුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු.188,483,608 ක් වටිනාකමැති ගිණුම් විෂයයන් 15 කට අදාලව ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා අදාල උපලේඛන සහ හිඟ ආදායම්වලට අදාලව ප්‍රා.ස 07 වාර්තා ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

## 1.3.6 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවන අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (i) හා 152 (i) වගන්ති | කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තු පිළියෙල කර සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 හා 67 | සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ව්‍යාපාර බදු අය කිරීම හා වෙලඳ බලපත්‍ර ලබාදීම් වලට අදාලව ඉහත රීති ප්‍රකාරව සමීක්ෂණයක් පවත්වා එවැනි ස්ථාන හඳුනාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 396 | සභාවේ ගිණුම් අංක 7626156 දරන බැංකු ගිණුමට අදාල 2015 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම අනුව නිකුත් කල නමුත් මාස 06 ඉක්මවූ වටිනාකම රු.187,622 ක් වූ චෙක්පත් 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වසර දෙකකට වඩා වැඩි කාලයක සිට පවතින රු.242,679 ක තැන්පතු ශේෂ 104 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 715 (2) ´අ´ | සභාව සතුව තිබූ ගොඩනැගිල්ලක් කඩා ඉවත් කල, විවිධ ද්‍රව්‍ය සහා පරිශ්‍රයේ තැන තැන අවිධිමත් ලෙස ගොඩගසා ස්වාභාවික උපද්‍රවයන්ට ලක් වෙමින් විනාශ වෙමින් පැවතුණි. |

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.4,358,324ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.2,865,594 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,492,730 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.6,552,741 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.10,944,580 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.33,515 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම හා වියදම අදාල විචලනයන් සමඟ පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 11,348 | 9,637 | 1,711 | පෞද්ගලික පඩිනඩි | 65,931 | 45,448 | 20,483 |
| (ii) | වෙනත් | 76,580 | 61,619 | 14,961 | අනෙකුත් | 17,638 | 22,943 | (5,305) |
| | උප එකතුව | 87,928 | 71,256 | 16,672 | උප එකතුව | 83,569 | 68,391 | 15,178 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 6,552 | 16,339 | (9,787) | ප්‍රාග්ධන වියදම | 10,945 | 19,449 | (8,504) |
| | මුළු එකතුව | 94,480 | 87,595 | 6,885 | මුළු එකතුව | 94,514 | 87,840 | 6,674 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 4,358 | 2,865 | 1,493 | අතිරික්තය/ ඌනතාවය | (34) | (245) | 211 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.87,926,993 න් සියයට 79 ක් හෙවත් රු.69,046,783 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.6,552,741 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම

වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.83,568,669 න් සියයට 78 ක් හෙවත් රු.65,930,830 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 61 ක් හෙවත් රු.40,035,077 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.10,944,580 න් සියයට 43 ක් ලෙස රු.4,709,334 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබූ අතර ඉතිරි සියයට 57 ක් වූ රු.6,235,246 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තත්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 1,834 | 1,606 | 4,633 | 1,834 | 1,087 | 4,333 |
| (ii) බදුකුලී | 8,921 | 5,348 | 2,103 | 9,768 | 2,057 | 2,523 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,205 | 1,225 | 70 | 1,205 | 1,126 | 73 |
| (iv) වෙනත් ආදායම් | 112,840 | 79,749 | 18,888 | 72,110 | 42,586 | 15,602 |
| එකතුව | 124,800 | 87,928 | 25,694 | 84,917 | 46,856 | 22,531 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | ආදායම් රැස් කිරීම 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | හිඟහිටි ශේෂය 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | ගණනය කිරීම් අනුව ශේෂය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 4,333,803 | 1,834,000 | 6,167,803 | 1,094,691 | 368,000 | 1,462,691 | 3,239,112 | 1,466,000 | 4,705,112 | 4,633,137 |
| කුලී ආදායම් | 2,532,098 | 8,921,000 | 11,453,098 | 428,682 | 3,726,189 | 4,154,871 | 2,103,416 | 5,194,811 | 7,298,227 | 2,103,416 |
| බලපත්‍ර ගාස්තු | 73,400 | 1,205,000 | 1,278,400 | 3,000 | 1,221,670 | 1,224,670 | 70,400 | - | 70,400 | 70,400 |
| සේවා සඳහා ගාස්තු | 54,900 | 3,114,825 | 3,169,725 | 34,500 | 3,114,825 | 3,149,325 | 20,400 | - | 20,400 | - |
| වරෙන්තු ගාස්තු හා දඩ | 504,500 | 3,029,000 | 3,533,500 | 504,500 | 549,167 | 1,053,667 | - | 2,479,833 | 2,479,833 | -531,833 |
| වෙනත් ආදායම් | 8,843,516 | 2,130,500 | 10,974,016 | 8,500,000 | 18,117,536 | 26,617,536 | 343,516 | - | 343,516 | 12,321,997 |
| ආදායම් ආධාර | 6,597,311 | 81,360,982 | 87,958,293 | 6,387,311 | 42,520,411 | 48,907,722 | 210,000 | 38,840,571 | 39,050,571 | 6,034,979 |

සභාවේ ආදායම් ලේඛන පවත්වාගෙන යාමේ අඩුපාඩු හේතුවෙන් ගණනය කිරීම අනුව 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂයන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ශේෂයන් සමඟ නොසැසඳේ.

### 2.3.3 වරිපනම් හා බදු

වරිපනම් හා බදු යටතේ සමාලෝචිත වර්ෂයට අදාල රු.1,834,000 ක ආදායමක් ඇස්තමේන්තු කර පැවතියද, මෙයින් අයකර පැවතියේ රු.368,000 ක් හෙවත් සියයට 20 ක් පමණි. එමෙන්ම ආරම්භක හිඟය රු. 4,333 ක් වූ අතර ඉන් කිසිදු මුදලක් වර්ෂය තුළ අයකර නොතිබූ බැවින් වාර්ෂික ආරම්භක හිඟය වර්ෂය අවසානය වන විටද පැවතුණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශය තුල ත්‍රීරෝද රථ නැවතුම් පොලවල් 09 ක් පැවති අතර 2015 දෙසැම්බර් 30 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ලබාගත් තොරතුරු අනුව විගණන දිනය වන විට එම නැවතුම් පොලවල්වල ත්‍රී රෝද රථ 70 ක් පමණ ගාල්කර තිබුණි. නමුත් සභාව ත්‍රී රෝද රථ සඳහා ගාස්තු අයකර බලපත්‍ර ලබා දීමට රීති සකස් කර ගාස්තු ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත්කර නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂය අවසානය වන විට ස්ථිර සේවකයින් 10 දෙනෙකුට හා දෛනික වැටුප් ලබන කම්කරුවන් 15 දෙනෙකුට ලබා දී තිබුණු සේවක ණය වසර 01 සිට වසර 06 දක්වා කාල පරාසයක සිට අය නොවන රු.402,470 ක ශේෂයක් පැවතුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සෞඛ්‍ය කම්කරුවන් 18 දෙනෙකු සේවයේ යෙදී සිටි අතර ඉන් 08 දෙනෙකුගේම පැමිණීම දුර්වල තත්ත්වයේ පැවතීම හේතුවෙන් සභා බල ප්‍රදේශයේ කැලි කසල බැහැර කිරීම, 2015 දෙසැම්බර් 31 දින නගරයේ කාණු හා මංමාවත් නඩත්තු කටයුතු, පොළ භූමිය පවිත්‍ර කිරීම් නිසි පරිදි සිදු නොවන බව 2015 දෙසැම්බර් 31 භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර සභාවේ සෞඛ්‍ය කම්කරුවන් 08 දෙනෙකු 2015 වර්ෂය තුළ වැටුප් රහිත නිවාඩු දින 411 ක් ලබාගෙන තිබුණි.

(ආ) සභාවේ ඉඩම් කට්ටි 69 කින් යුත් වැලි කුඹුර දල්ගොල්ල වත්ත ඉඩම් කට්ටි සැලැස්ම 2015 ජූනි 26 දින අනුමත කර තිබුණු අතර පොදු කොටස සඳහා පර්චස් 89.8 කින් යුත් කට්ටි අංක 46 වෙන්කර තිබුණි. ඵලදාව සහිත පොල්ගස් 20 ක් පමණ අදාල කොටස තුල පැවති අතර ඵලදාව රැස්කර ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ඉඩම් කොටස් සඳහා විදුලිය හා ජල පහසුකම්ද ලබා දී නොතිබුණි.

(ඇ) සභාවේ වසර ගණනාවක සිට අක්‍රීය තත්ත්වයේ තිබූ බැංකු ගිණුම් 5 කට අදාල රු. 148,374 ක ශේෂයක් පැවතින.

(ඈ) සභා බල ප්‍රදේශයේ දුරකතන සම්ප්‍රේෂණ කුළුණු 11 ක් පැවතියද, ඒවා හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. තවද දුරකතන සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපිත කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර ලබාගෙන ඉදි කිරීමෙන් පසු අනුකූලතා සහතික ලබාගත යුතු වුවද, සභාවේ අනුකූලතා සහතික නිකුත් කිරීම් පිළිබඳ පරීක්ෂාවේදී කිසිදු දුරකතන සම්ප්‍රේෂණ කුළුණක් සඳහා අනුකූලතා සහතික වසර ගණනාවකට පෙර සිට නිකුත් කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සභා දේපල බදු දීම සඳහා වත්කම් 33 ක් ඉදිරිපත් කර තිබූ අතර ඉන් බදු දිය හැකිව තිබුණේ වත්කම් 12 ක් පමණි. බදු දිය නොහැකි වූ වත්කම් 2014 වර්ෂයේ සිටම බදු දී නොතිබූ අතර එතැන් සිට 2015 දෙසැම්බර් 30 දක්වාම කිසිදු ආදායමක් උපයා හෝ ආදායම් ඉපැයීමට ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි. මෙසේ බදු දීමට නොහැකිව තිබූ වත්කම් 18 හි අවම ලංසුවේ වටිනාකම රු. 410,393 ක් විය.

## 04 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

### 4.1 වත්කම් කළමනාකරණය

### 4.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වාහන 02 ක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතීමෙන් දිරාපත්වෙමින් පැවතුණි.

(ආ) සභා පරිශ්‍රයේ ඇති ටොයෝටා වර්ගයේ ගිලන් රථය නිෂ්පාදන වර්ෂය, සභාවට ලැබුණු දිනය ඇතුළු තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණු අතර විගණන දිනය වූ 2015 දෙසැම්බර් වන විටද ලියාපදිංචියකින් තොරව සේවයේ යෙදවීමකින්ද තොරව දිරාපත් වෙමින් පැවතුණි.

### 4.3 හඳුනාගත් අලාභ

2014 වර්ෂයේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාවට ලද GI බට 506 න් වර්ෂය අවසානය වන විට රු.550,000 ක් පමණ වටිනා බට 275 ක ඌනතාවයක් පැවතුණි.

### 4.4 අයවැය පාලනය

ආදායම් විෂයයන් 05 ක සියයට 24 සිට සියයට 65 දක්වා අයවැයගත තත්ත්වය හා තත්‍ය තත්ත්වය අතර රු.47,298,825 ක වෙනස්කම් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොමැති බව නිරීක්ෂණය කරනු ලැබේ.

### 4.5 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.6 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් කළමනාකරණ කමිටු 12 ක් පවත්වා තිබුණද, විගණන හා කළමනාකරණ කමිටු කිසිවක් පවත්වා නොතිබුණි.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය